

# ආයුර්වේද සංග්‍රහය




සෑම් දසනායක

ආයුර්වේද වෛද්‍ය

මාලේවන ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රී උපාධිය (ශ්‍රී ලංකාව)
පංචකර්ම පිළිබඳ පශ්චාත් උපාධිය (ඉන්දියාව)


ඔස් නිව්ස් ලංකා මංගල කලාපයේ ආයුර්වේද සංග්‍රහය සඳහා එකතු වන්නේ මාලේවන ආයුර්වේද වෛද්‍ය ශාස්ත්‍රී උපාධිය (ශ්‍රී ලංකාව) සහ පංචකර්ම පිළිබඳ පශ්චාත් උපාධිය ලත් ආයුර්වේද වෛද්‍ය සෑම් දසනායක මහතා.

*වෛද්‍යතුමනි ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් සහ ඕස්ට්‍රේලියානුවන්ට ප්‍රතිකාර කරන විට බහුලව දක්නට ලැබෙන රෝගයන් මොනවාද?*

බහුලව තිබෙන ලෙඩ රෝග ගැන කතා කරන විට, ආහාර ජීර්ණය සම්බන්ධව තිබෙන්නාවූ රෝග බහුලය. ඕස්ට්‍රේලියාවේ වෙසෙන ලාංකිකයන්ට වගේම ඕස්ට්‍රේලියානුවන්ටත් ගැස්ට්‍රයිටීස් හෙවත් අම්ල පිත්තය බහුලව දක්නට ලැබෙන රෝග යක්. නමුත් මෙහි වැදගත්ම දෙය නම් මෙය බොහෝමයක් දෙනා රෝගයක් ලෙස සලකනු ලබන්නේ නැහැ. එදිනෙදා ජීවිතයේ මේ රෝගයත් සමගම ජීවත් වන්න පුරුදු වනවා. අම්ල පිත්තයේ දී සිදුවන්නේ ආහාර ජීර්ණය අඩාල වීම නිසා ආමාශික යුෂත් සමග උපදින ගෑස් එක අපේ ගලනාලය පුච්චාගෙන උඩට එමත් සමග උගුරේ දැවිල්ල, බඩ දැවිල්ල සමග බඩ පුරෝදැමීමත් නිසා අම්ල පිත්ත රෝගය ඇතිවෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමයේ එන ක්ෂණික ප්‍රතිකාර මේ සඳහා තිබෙනවා, ගැවිස්කෝන් නමින් හඳුන්වන විවිධ ආකාරයේ බෙහෙත් මගින් ඒ දවසේ තියෙන පීඩාව අඩු කරන මුත් රෝග දෝෂය සුව වීමක් මෙමගින් සිදු වන්නේ නැහැ. මේ ආකාරයට දීර්ඝ කාලයක් යන විට ගලනාලයෙහි තුවාල ඇති වීමත් සමග රෝගය බරපතල වෙනවා. එවිට කුළුබඩු යොදා සකස් කරන සුළු ආහාරයක්වත් කන්නට නොහැකි වනවා. ඊට පසුව තමා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට යොමුවන්නේ. මෙම රෝගයේ මුල් කාලයේදීම ආයුර්වේද වෛද්‍යවරයෙක් හමුවූ විට සාමාන්‍යයෙන් අත්බෙහෙත් තමා යොදාගනු ලබන්නේ. අපට සාමාන්‍යයෙන් මුළුතැන්ගෙයි තිබෙන ඖෂධ වලින්ම බෙහෙතක් හදාගන්නට පුළුවන්. මේ සම්බන්ධයෙන් මිනිසුන්ට තිබෙන දැනුම අඩුකම නිසා රෝග උග්‍ර වෙනවා. මේ නිසා විවිධ වූ අපහසුතාවයන්ට ලක්වෙනවා. කටින් පිටවන ආම්ලික



වාතය නිසා එයින් දුර්ගන්ධයක් පිටවෙනවා. මේ නිසා තම කාර්යාලයට පවා යෑමට නොහැකි බව පවසමින් රෝගීන් පැමිණෙනවා. ආයුර්වේදයෙහි ඉතාම පොඩි බෙහෙත් තමා මේ රෝගය සඳහා තිබෙන්නේ.

*ඔබ පොඩි බෙහෙත් යනුවෙන් සඳහන් කළත් ලාංකිකයන් අතර මතයක් පවතිනවා ආයුර්වේද බෙහෙත් කිරීමට සෑහෙන කල්ගතවීමකුත් ඒ වගේම ප්‍රායෝගිකව සුව කළ නොහැකියි කියා, ඔබ මේ සම්බන්ධයෙන් දරන්නේ කුමන අදහසක්ද?*

ඔව්, ඇත්තටම අද තිබෙන අවිවේකී ජීවන රටාවත් සමග හැමෝම හරිම කාර්‍යබහුලයි ඇත්තටම බටහිර වෛද්‍ය ක්‍රමයේ රෝගියාගේ රෝග ලක්ෂණයට ප්‍රතිකරන අතර රෝග නිධානයට ප්‍රතිකාර කිරීමක් සිදු වන්නේ නැහැ. ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ සිදුවන්නේ රෝග නිධානයට ප්‍රතිකාර කිරීමයි. රෝග නිධානය වටහා ගෙන ප්‍රතිකාර කරන විට රෝග ලක්ෂණවලට ප්‍රතිකාර කිරීමක් සිදු නොවන නිසා රෝග නිවාරණයට ටික කාලයක් ගතවනවා. මෙසේ ටික කාලයක් ගත වුවත් රෝගය නැවත ඇති නොවන්නට තමා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාර කරන්නේ. ප්‍රායෝගිකව ගත්විට දවස් දෙකකින් රෝගය සුව කිරීමට නොහැකියි. රෝගියා තමා තීරණයක් ගත යුත්තේ දවස් දෙකකින් හොඳවන නමුත් නිට්ටාවට සුව නොවන බෙහෙතක් ගන්නවද නැත්නම් සුමාන දෙකක් පමණ ප්‍රතිකාර ගෙන රෝගය නිට්ටාවටම සුව කරන්නවාද කියා. බුද්ධිමත් තීරණයක් ගැනීමේ අයිතිය අපි හැමෝම සතුයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගැන දැනීමක් නොමැති කම නිසා එහි තිබෙන්නාවූ විශ්ව කර්ම ශක්තිය ගැන බොහෝ දෙනා දන්නේ නැහැ. මේ පිළිබඳව ඇත්තටම තේරුම් ගැනීමට හැකිනම් කොපමණ හොඳද?

*ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන් මෙන්ම ඕස්ට්‍රේලියානුවන් කෙසේද ආයුර්වේද බෙහෙත් වලට ඔවුන්ගේ ප්‍රතිචාරය දක්වන්නේ?*

ඇත්තටම මෙහි කණ්ඩායම් කීපයක් සිටිනවා. ඕස්ට්‍රේලියානුවන් බොහෝ දෙනෙක් පැමිණෙන්නේ ඉන්දියාවේ හෝ ලංකාවෙන් ආයුර්වේද පංචකර්ම ප්‍රතිකර්ම සෑපුවම ගෙන එයින්